

අන්ධකාරයේ
සෙවණැලි
GUARDIANS
OVER
THE
SHADOW
R.M.සඳලි තාරකා රත්නායක

# ~GUARDIANS OVER THE SHADOW~

# *අන්ධකාරයේ සෙවණැලි*

## *R.M. සඳලි තාරකා රත්නායක*

***කතෘගේ වෙනත් කෘති:***

***. අද්භූත මායා තොප්පිය***


*මහාමායා බාලිකා විද්‍යාලය*

***09 ශ්‍රේණිය***



***2025.02.08***

**978-624-208-863-1**

# ~පිදුම~

කුඩා කල සිට මා හැදූ වැඩූ මාගේ

දෙමාපියන්ටත්

සිප් සතරින් මා පෝෂණය කල

ගුරුවරුන්ටත්

දුකේදීත් සැපේදීත් ලඟින්ම ඉදන් මා දිරිමත් කල

මාගේ ආදරණීය

මිතුරු මිතුරියන්ටත්

නිමක් නැති දිවි කතරේ ලපටි සිහින කරා

පියමං කරන පුංචි සිත් වෙනුවෙනුත්

මේ පොත

ආදරයෙන් පුදමි...!

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත්ග් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නඟා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **" හෙරණගත්කරණී "** ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

# අලුත් දවසක්...

“ පුතේ ඉක්මනට ලෑස්ති වෙන්න. අද ඔයාට සම්මුඛ පරීක්ෂණයට යන්න තියෙනවා. වෙලාගියොත් එහෙම ඔයාට යන එබෑරි වෙයි ”

“ හරි අම්මේ බය වෙන්න එපා. මන් ඉක්මනට ලෑස්ති වෙන්නම් ” සෙලීනා කීවාය.

එක්තරා සුන්දර උදෑසනක සෙලීනා ඇගේ සම්මුඛ පරීක්ෂණයට යෑමට සූදානම් වූයේ ඇගේ අලුත් පාසලට ඇතුලු වීම සඳහායි. ඇය නමින් සෙලීනා නයිට්ශේඩ්, වයස අවුරුදු 18 ක් පමණ වයසැති ශිෂ්‍යාවක් වූවාය.

කිරි වීදුරුව පානය කල සෙලීනා ඉක්මනට පරීක්ෂණයට යන ලෑස්ති වූවාය. ඉක්මනින් උදේ ආහාරය ගත් ඇය සම්මුඛ පරීක්ෂණයට යාමට පිටත් වූවාය.

“ පරිස්සමින් ගිහින් එන්න පුතේ ” සෙලීනාගේ මව සහ පියා ඇයට සමු දුන්නෝය.

ඉක්මනින්ම පිටත් වූ ඇය මුලින්ම පැමිණි බස් රථයට ගොඩවූවත් එය තරමක් සෙනගින් පිරී තිබිණි. පැයක පමණ ගමනකින් ඇය පරීක්ෂණය පවත්වන ස්ථානයට ළඟා වූවාය. සෙලීනා එක්වරම පුදුමයට පත් විය.

“ මෙච්චර ළමයි ගොඩක්... ” සෙලීනා තමාටම කියා ගත්තාය. ඇය දුටුවේ ළමයින් විශාල පිරිසක් පරීක්ෂණයට සහභාගී වී ඇති ආකාරයයි. ඇතැම් ළමුන් කුඩා කණ්ඩායම්ලෙස එක් රැස් වී කතාබහේ නිරත වෙමින් සිටියහ. ඇතැම් සිසුන් මිතුරන් සමඟ තම විස්තර බෙදා ගනිමින් සිටියහ. සෙලීනා ඇවිද ගොස් පෝලිමේ පසුපසම සිට ගත්තාය.

පැය දෙකකට පමණ පසු ඇය පරීක්ෂණය සනමත් වී සතුටින් නිවසට පැමිණියාය.

පහුවදා උදාසනම සෙලීනා පාසල් නිළ ඇඳුමින් සැරසී Elysium Guard High School හි පළමු දිනය සඳහා පිටත් වූවාය.

* * *

ඒ ග්‍රීෂ්ම කාලයේ එක්තරා සුන්දර උදෑසනකි. සෙනඟ නිසා සිරවෙලාම ප්‍රධාන මාර්ගය ඔස්සේ බස් රථයක පැමිණි සෙලීනා බසයෙන් බැස පයින් ගසින් හැඩවී ඇති මාවත දිගේ පාසල දෙසට ඇය ඇවිසද ආවේ කිසියම් චකිතයකින්ද යුක්තවයි. පාසලට ඇතුලු වන ස්ථානයේ විශාල කලු පැහැති ගේට්ටුවක් දිස් වූ අතර එම ගේට්ටුව මුදුනේ Elysium Guard High School ලෙස රන්වන් පැහැති අකුරින් පාසලේ නම සඳහන් කර තිබුණි. අඩක් විවත කර තිබූ ගේට්ටුවෙන් ඇතුල් වූ ඇය දුටුවේ සුදු පැහැති ගල් ඇතිරූ අලංකාර මාවතකි. මාවත

දිගේ ඉදිරියට ඇදුණු ඇයට අලංකාර සුදු ගලින් නිම කරන ගොඩනැගිලි බොහෝමයක් දැකගත හැකි විය. ප්‍රධාන ගොඩනැගිල්ලට පිවිසෙන මාර්ගය දෙපස මේපල් ගස් වලින් හා රොබරෝසියා ගස් වලින් ද විවිධ රූප මවන ලද විසිතුරු ශාක වලින්ද අලංකාර කර තිබුණි. පසෙකින් වූ කුමුදු මලින් පිරි පොකුණද මාර්ගයට තවත් අලංකාරයක් ගෙන දුන්නේය. පොකුණ මැද පිහිටි ග්‍රීක කන්‍යාවකගේ ඉහළට එස වී තිබුණු වම් අතින් වැටෙන වතුරින් නැහැවෙන පොකුණ කාගෙත් සිත් ගත්තේය. මාර්ගය දෙපස වැවී තිබුණු ලිලී හා ටියුලිප් මල් පදුරු අවට පරිසරයට සුන්දරත්වයක් ගෙන දුන්නේය.

සෙලීනා ප්‍රධාන ගොඩනැගිල්ල හරහා ගොස් තම පංති කාමරය සොයා ගත්තාය. පංති කාමරයට පිවිසෙන දොර විත කල සෙලීනා දුටුවේ ළමුන් විසි දෙනෙකුගෙන් සමන්විත පංති කාමරයකි.

බොහෝ සිසුන් මේසමත හිදගෙන කතාබහේ යෙදීසිටි අතර තවක් සමහරෙක් තම තමන්ගේ කාර්යයන්වල යෙදී සිටියහ. සෙලේන සම්මුඛ පරීක්ෂණය දා දුටු සමහරක් සිසුන්ද එම පංති කාමරයේ සිටිනු ඇය දුටුවාය. තවත් සිසුන් කිහිප දෙනෙකු ජනේලයෙන් පිටත බලාගෙන සිටියහ. පංති කාමරයට ඇතුලු වූ සෙලීනාව දුටු ඇතැම් සිසුන් රහසින් කොඳුරන්නට විය.

“ මෙයත් අලුත් ළමයෙක්ද කොහෙදෝ. කොහේ ඉදන්ද දන්නෑ ආවේ ” වැනි දෑ ඔවුන් කොඳුරන්නට විය.

එක් සිසුවෙකු පැමිණ ඇයට කතා කළේය. “ මම ටෙරියන් ග්‍රේසන්. ඔයා මට ටෙරී කියන්න. මමත් අද තමයි මුලින්ම ආවේ. ඔයාගේ නම මොකද්ද? ” ඔහු ඇසුවේය.

“ මම සෙලීනා නයිට්ශේඩ් ” කියූ ඇය සිහින් සිනාවකින් පමණක් ඔහුට සංග්‍රහ කළාය.

ඉන්පසු ටෙරියන් ඇයට පන්තියේ අවසාන පේළියේ තිබූ අසුනක් පෙන්වමින් එය සෙලීනාගේ මේසය බව පැවසුවේය. එතනට ගිය සෙලීනා දුටුවේ එක් සිසුවියක් පමණක් ඇයට ඉදිරි ආසනයේ තනියම සිටින බවයි. ඇය කලු පැහැති කෙස් කලඹකින් ගහා කැලැල් සහිත මුහුණකින් යුක්ත වූවාය. ඇයට කිසිදු මිතුරෙකු නැති බව සෙලීනාට සිතුණි. ටෙරියන් පැමිණ සෙලීනාට ඔහුගේ පවුලේ විස්තර මෙන්ම ඔහු ගැන බොහෝ දෑ පැවසුවේය. ඔහු පැවසුවේ ඔහුගේ එකම මිතුරා සෙලීන වන බවයි. නමුත් සෙලීනා කිසිවක් නොකියා සිනාවකින් පමණක් ඇයට සංග්‍රහ කළාය.

එක්වරම දොර විත කරගෙන කිසිවකු පංති කාමරයට පිවිසි නිසා පංති කාමරය නිහඬතාවයේ රජයන්නට විය. ඒ තරුන ගුරුවරියකි. ඇටය රන්වන් පැහැති හිසකෙස්වලින් හා නීල වර්ණ ඇස් දෙපළකින් යුක්ත විය. ගුරු මේසය අසලට ගිය ඇය ඇයවම හඳුන්වා දුන්නාය.

" සුබ උදෑසනක් ලළමයිනේ මම තමයි මේ සැරේ ඔයාලගේ ක්ලාස් ටීචර්. ඔයාල ගොඩක් අය අලුත් අය වෙන්න ඇති කියල මම හිතනවා. මගේ නම ඇමේලියා රෝස් " යැයි පැවසූ මිසිස් රෝස් සියල්ලන්ටම සිනාවකින් සංග්‍රහ කළාය. ඉන්පසු ළමුන් සියලු දෙනාම තම තමන්ව අනෙක් සිසුන්ටත් හදුබන්වා දුන්හ. සෙලීනාත් තමන්ව හදුන්වා දුන් අතර ඇය ඇයට ඉරදිරියෙන් සිටි සිසුවියගේ නම ලයිරා මූන්ස්ටෝන් බව දැන ගත්තාය.

පාසල නිමා වීමේ සීනුව නාද වූ අතර සුයලුම සිසුන් නිවෙස් වලට යාමට පිටත් වූහ. සෙලීනා අවසානෙටම පංතියෙන් පිටත් වූවාය. එවිට ඇය දුටුවේ ලයිරා තවමත් පංතියේ සිටින බවයි. ඇය ගොස් ලයිරාට කතා කළාය.

" හායි. ඔයා ගෙදර යන්නෙ නැද්ද? " සෙලීනා ඇසුවාය. "මම තවටිකකින් යන්නම්" ලයිරා කී අතර ඒත් සමගම සෙලීන ඇයගෙන් අපි යලුවෝ වෙමුදැයි ඇසූ පසු ඇය එක්වරම හා කීවාය. ඔවුන් දෙදෙනාම එකට පංති කාමරයෙන් පිටතට ඇවිද ගිය අතර ඔවුන් තම තමන්ගේ විස්තර එකිනෙකා අතර බෙදා ගත්හ. ඉන්පසු ඔවුන් නිවෙස් වලට ඇවිද ගිය අතර සෙලීනා අලුත් පාස්ලේ පළමු දිනය මෙසේ නිමා විය.

*   *   *

පහුවදා උදාසනම් අවදි වූ සෙලීනා පාසලට යාමට පිටත් වූවාය. සෙලීනා යන විටත් පාසලට පැමිණ සිටි ලයිරා සෙලීනාට සුබ උදෑසනක් ප්‍රාර්ථනා කල අතර ඔවුන් දෙදෙනාම පාසලේ නොදුටු තැන් බලීමට ඇවිද ගියහ. ඒත් සමගම ටේරියනුත් පැමිණ ඔවුන් දෙදෙනාට එකතු වූයේය. ඔවුන් තිදෙනාම පාසල පුරාම කතාබහේ යෙදෙමින් ඇවිද යන්නට විය.

මෙසේ කෙමෙන් කෙමෙන් දින ගෙවී යන්නට විය. එක් දිනක් සෙලීනා උදෑසනම පැමිණ පාසලේ ප්‍රධාන මාවත දිගේ ඇවිද එන විට ඇයට කිසියම් දෙයක් පෑගුණි. ඇය බිමට නැමී බැලූ විට ඇය දුටුවේ ඉතා පැරණි, පැරණි යුගයකට අයත් යැයි සිතිය හැකි රන්වන් පැහැති යතුරකි. සළුම යතුර ඇහිද ගත් ඇය තම පංති කාමරය දෙසට ගියාය. පංති කාමරයට ඇතුලු වූ සෙලීන දුටුවේ ඒ වෙනවිටත් පාසලට පැමින සිටි ලයිරා සහ ටේරියන් කතාබහේ යෙදී සිටින ආකාරයයි. ඉක්මනට ඔවුබන් අසලට ඇවිද ගිය සෙලීනා ඔවුන් දෙදෙනාට තමා වෙතට ළං වෙන ලෙස පැවසුවාය. ඔවුන් දෙදෙනාත් සෙලීනට ළං වූයේ සිදුවන්නේ කුමක්දැයි සිතාගත නොහැකිවයි. සෙලීනාට ළංවූ ඔවුන් දෙදෙනා දුටු දෙයින් මහත් විස්මයට පත්විය. සෙලීනා යතුරත් එය හමුවූ ආකාරයත් පවසුවාය. ලයිරා නම් පැවසුවේ ඇය කිසිදු දිනෙක මෙවැනි යතුරක් පිළිබද අසා නොමැති බවයි. නමුත් එක්වරම ටේරියන් පවසුවේ ඔහු පාසලට පැමිණි මුල්ම දාවසේ ළමුන් කිහිප දෙනෙක් පාසලේ කිසියම් රහසක් සැගවී ඇති බවත් එය තවමත් කිසිවෙකු සොයා ගෙන නැති බවත් පාසලේ කොතැනක හෝ රහස් දොරක් ඇති බවත් එයට ඇතුලු වූවන් කිසිවෙකුත් නැවත එළියට නොපමිණි බවත් ඔහු පැවසුවේය. ටේරියන් පැවසුවේ ලමුන් කතාවූ ආකාරයට එය පාසලේ අතහැර දමූ පැරණි අංශයේ ඇති බවයි. ටේරියන් පැවසූ දෙය අසුවාත් සමග තිදෙබනාගේම කුතුහලය තව තවත් වැඩි විය.

පාසල නිමා වී නිවසට පැමිණි සෙලීනා එම පැරණි යතුර ගැනත් එම රහස් දොර ගැනත් යතුර පසුපස සැගවී ඇති රහස කුමක්දැයි දැඩි කල්පනාවක නිමග්න විය. ඒත් එක්කම අවසානයේ ඇයට නොදැනීම නින්ද ගියේය.

# පැරණි අංශය...

පහුවදා උදාසනම සෙලීනා, ලයිරා සහ ටෙරියන් තිදෙනාම පරණි අංශය දෙසට ඇවිද ගියේ රහස් දොර සොයා ගනීම පිණිසයි. ඔවුන්ට හමුවුණු යතුර ගැන කිසිවෙකුට නොපැවසූ ඔවුන් ඉදිරියට ඇවිද ගියහ. පැරණි අංශයට ඇතුල් වූ ඔවුන් තිදෙනා පරණ ශාලාවේ කොරිඩෝව දිගේ ඉදිරියටම ගමන් කළහ. අතහැර දැමූ ශාලාවෙහි බිත්ති වියැකී ගොස් ඉරිතලා ගොස් තිබුණි. පාඅසල ආරම්භ කල මුල් කාලයේ එහි සිටිනු ඇතැයි සිතිය හැකි විදුහල්පතිවරුන්, ගුරුවරුන් හා ජනප්‍රිය ශිෂ්‍ය ශිෂ්‍යාන්ගේ ඡායරූප ශාලාවේ බිත්තියේ තැනින් තැන එල්ලා තිබුණි. ඇතැම් ඒවා මකුළු දැල් බැඳී තිබුණු අතර ඇතැම් ඒවායේ වීදුරු බිඳී ගොස් තිබුණි. තරමක් අඳුරු ස්වාභාවයක් ගත් කොරිඩෝවේ තැනින් තැන මකුළු දැල් බැඳී අපවිත්‍ර වී තිබුණි. එමෙන්ම ඇතැම් ස්ථානවල පැරණි කුසලාන බොහෝමයක් දැකිය හැකි විය. කොරිඩෝවේ තිබූ ජනේලවල වීදුරු බිඳී අබලන් වී පැවතුණි. එම දූවිලි පිරුණු කුසලාන දශක ගණනාවක් පැරණි ඒවා යැයි සිතිය හැකි විය. ඉදිරියටම ඇදුනු ඔවුන් අවසානයේදී ශාලාවේ අවසානය දක්කෝය. එහි පැරණි නමුත් ශක්තිමත් ඕක් දවයෙන් කරන ලද දොරක් විය. එය අසලට ළං වූ ඔවුන් දුටුවේ දොර අඟුලු දා ඇති බවයි.

එක්වරම පාසල පටන් ගන්නා සීනුව ඇතින් නාදවනු ඔවුන්ට ඇසුණි.

" දැන් හොඳටම වෙලා ගිහින් තියෙන්නේ අපි හෙට උදේම ආයෙත් එමු මේක මොකද්ද බලන්න " සෙලීනා කීවාය.

" ඔව් ඒක හොදයි. අපි පරණ අංශයේ ඉන්නවා දැක්කොත් ප්‍රශ්නයක් වෙයි. දැන් යමු... මේ රහස අපි අතරේ විතරක් තියාගමු " ලයිරා කීවාය.

" ඔව් ඔව් දැන් බෙල් එකත් ගැමුවනේ. ඉක්මනට යමු " යැයි පැවසූ ටෙරියන් අනෙක් දෙදෙනාත් සමඟ නැවත පැරණි අංශයෙන් පිටතට ගියහ. ඔවුන් මේ සෑම දෙයක්ම රහසක් විදියටම තබා ගැනීමට කටයුතු කළහ. නමුත් පැරණි අංශය අතහැර දැමුවේ කුමන හේතුවක් නිසාදැයි කවුරුත් දන සිටියේ නැත.

* * *

පසුදා උදෑසනම මොවුන් තිදෙනා පරණ අංශය අසලදී හමු විය. ඔවුන් අවශ්‍ය කරන විදුලි පන්දම්,ආහාර,ලණු මේ සියල්ලම රැගෙන විත් තිබුණි. ඔවුන් ඉතා නොඉවසිල්ලෙන් හිටියේ පරණ අංශයේ ඇති අභිරහස කුමක්දැයි දැන ගැනීමටයි. පාසල අවසන් වීමේ සිනුව නාද විය. සිසුන් තිදෙනාම හැකි ඉක්මනින් නැවත පරණ අංශය වෙත ගියහ.

ඔවුන් තිදෙනාම ඕක් ද්වාරය අසලට ළඟා විය. සෙලීනා තම සාක්කුවේ තිබූ යතුර ගෙන යතුරු සිදුරට ඇතුලු ලකළාය. අනෙක් දෙදෙනාත් විස්මයෙන් යුතුව ඒ දෙස බලා සිටියහ. ඔවුන් දෙදෙනා එක්වරම මුහුණට මුහුණ බලා ගත්තේ සිදුවන කිසිවක් සිතා ගනීමට නොහැකිවය. එක්වරම සියල්ලෝම පුදුම කරමින් කුඩා ශබ්දයක් නගමින් දොර විවෘත විය. ඔවුන් තිදෙනාගේම හදවත් වේගයෙන් ස්පන්දනය වන්නට විය. විදුලි පන්දම ඇතුළට ඇල්ලූ ටේරියන් දුටුවේ එය මීට වසර ගණනාවකට පෙර අත්හැර දමන ලද කාමරයකි. එම කාමරය විවිධාකාර අමුතු හැඩවලින් යුක්ත වස්තු වලින් පිරී තිබුණි. එයට ඇතුලු වූ ඔවුන් දුටුවේ එහි මුලක තිබූ තරමක් විශාල කණ්ණාඩියකි. එය තරමක් උස වූ අතර එය ප්‍රතිබිම්භය පිළිබිඹු නොකරන කැඩපතක් විය.

තම විදුලි පන්දම් දල්වාගත් ඔවුන් කාමරය පුරා ගමන් කරමින් එහි ඇති දෑ නිරීක්ෂණය කරන්නට විය. බිත්තිය මුල්ලේ තිබූ රාක්ක එකින් එක පිරික්සූ සෙලීනා දුටුවේ එම ඇතැම් රාක්ක පොත්පත් වලින් පිරී තිබූ බවයි. එමෙන්ම පැරණි වියැකී ගිය අත් අකුරු වලින් යුක්ත සඟරා සහ විවිධ පොත්පත් ඇයට දැක ගන්නට හැකි විය.

ලයිරා හා ටේරීත් ඇතැම් රාක්ක පිරික්සූ අතර ටේරියන් එක් රාක්කයක තිබූ අත් කාවයක් බඳු යමක් අතට ගෙන නිරීක්ෂණය කළේය. වාතය සෝෂාකාරී නිශ්ශබ්දතාවයකින් යුක්ත වූ මෙම කාමරයේ තවත් ඉදිරියට ගමන් කල සෙලීනා එක් සඟරාවක් වෙත ළඟා වූ අතර එය කාළවර්ණ දැඩි සණකම් සත්ත්ව හමින් කරන ලද රන්වන් පාටින් එම්බ්‍රොයිඩර් කරන ලද පිටකවරයකින් යුක්ත විය. එය සෙලීනා අතට ගත් විටම එයින් කුඩා සටහනක් බිමට වැටුණි. එය ඇහිද ගත් සෙලීනා එය කියවා බලුවාය. එහි මෙසේ සඳහන්ව තිබිණි.

# පළමු සටහන...

*" සත්‍ය සොයා ගන්න. නමුත් ප්‍රවේසම් වන්න. සෑම පිළිතුරක් සඳහාම කැප කිරීමක් ඉල්ලා සිටී... "*

සෙලීනාට මෙහි සදහන් කිසිවක් තේරුම් ගැනීමට නොහැකි විය. සෙලීනා ඇයගේ මිතුරන් දෙදෙනාට කතා කළාය. එතනට පැමිණි ලයිරා හා ටෙරියන්ට ද එම සටහන පෙන්වූවාය.

"මොකද්ද මේකේ තේරුම? " ලයිරා ඇසුවාය. ඇගේ ඇස්වල බිය සහ කුතුහලයද මිශ්‍ර වී තිබුණි.

" සමහර විට හැංගිලා තියෙන දෙයක් අපිට හොයා ගන්න අදහස් කරනවාද දන්නේ නෑ " ටෙරියන් පැවසුවේ ගැඹුරු හුස්මක් ගනිමිනි.

ඔවුන් එම සටහන තිබූ සඟරාවෙහි පිටු ඉතා පරිස්සමින් පෙරලා බැලුවෝය. එහි විවිධ ගුප්ත සටහන් හා සිතියම් මෙන්ම කටු රූපද ඇද තිබුණි. එයින් එක් සිතියමක් පාසලේ සැලැස්මට බොහෝ සෙයින් සමාන විය. එහි ඇතැම් ස්ථාන සලකුණු කර තිබූ අතර සිතියමේ ඉරියටම තම අත රැගෙන ගිය සෙලීනාට එය පාසලේ සිතියමක් බව තේරුම් ගියාය. ඒ ඇතැම් සලකුණු පාසලට පහලින් ගැඹුරට වෙන්නට විහිදී ඇති මාර්ග බව ඔවුන්ට තේරුම් ගියහ.

එහි අවසාන පිටුව පෙරලූ ඔවුන් දුටුවේ ඔවුන්ගේ නමේ මුල් අකුරු සමග එහි යම් අනතුරු ඇඟවීමක් සදහන් වි ඇති ආකාරයයි. එහි සදහන් වී ඇත්තේ ඔවුන්ගේ නම් වල මුල් අකුරු බව ඔවුන්ට තේරුම් ගියේය.

*අනතුරු ඇඟවීමයි…!!!*

*To S , L , T*

*ඔබ මෙම ගමන ආරම්භ කල පසු නැවත හැරී බැලීමක් නැත.*

මෙය දුටු ඔවුන් තිදෙනාම බියට පත් විය. දැන් ඔවුන්ට තේරීමක් සිදු කිරීමට ඇත. මාර්ගය අනුගමනය කැරමින් අභිරහස හෙළි කරගත යුතුය නැතිනම් මෙම රහස අභිරහසක් ලෙස පමණක් අතහැර දමා සදහටම අමතක කල යුතුය…

නමුත් අනතුරු ඇඟවූ පරිදි ඔවුන්ට ඇඟවූ පරිදි ඔවුන්ට ආපසු හැරීමක් නොමැත. සිසුම් තිදෙනා සිතියම අනුගමනය අභිරහස විසදා ගැනීමට තීරණය කළහ.

සිතියම අනුගමනය කල ඔවුන් තිදෙනා කිසිවක් සිතා ගැනීමට නොහැකිව පැරණි දූවිලි සහිත පොත් රාක්කයක් පිටුපස සැගවුණු පටු පඩිපෙළකින් බැස ගොස් අත්හැර දමන ලද පුස්තකාලයක් හරහා ගොස් සළකුණු කල මාර්ගය සොයා ගත්හ. ඔවුන් තිදෙනාම කිසිදු කතාබහකින් තොරව ඉදිරියටම ගියහ. පඩිපෙළ අවසානයක් නොමැතිව පහළටම යෙදී තිබෙනු ඔවුන්ට දැකගන්නට හැකිවිය. සර්පිලාකාර පඩිපෙළ දිගේ පතුලටම බැසගත් ඔවුන් තෙත් වූ ගඩොලින් යුක්ත බිත්ති සහිත පුස් ගඳින් යුක්ත වාතයෙන් පිරි කොරිඩෝවක් සොයා ගත්හ. එය තරමක් අඳුරු ස්වාභාවයකින් යුක්ත විය. එයට ඇතුලු වූ ඔවුන් විදුලි පන්දම් දල්වා ගෙන ඉදිරියටම ගමන් ගත්හ.

“ මට හිතාගන්න බෑ මේ මොකද වෙන්නේ කියලා. ඉස්සෙල්ලාම යතුර ඊට පස්සේ පරණ අංශය , දොර , කැඩපත , අනතුරු ඇඟවීම . මේ මොනවද ? ” ඒ ලයිරාගේ හඬය.

“ මන් හිතන්නේ අපි දැන් ඉස්කෝලෙට යටින් ඉන්නේ ” ටේරියන් කීවේය.

“ මේක කොහෙන් නවතීද දන්නේ නෑ. මේ කොරිඩෝව නම් ඉවර වෙන පාටක් නෑ” සෙලීනා කීවේ හදවත වේගයෙන් ගැහෙද්දීය.

ඔවුන්ගේ සිතෙහි ඇති වූයේ මහත් චකිතයකි. ඔවුන්ගේ ඉරණම කෙසේ ලියැවී ඇත්ද? මේ පාසලේ සැඟවී ඇති අභිරහස කුමක්ද? මේ සිදුවන සියල්ලම ඔවුන්ට දැඩි ප්‍රහේලිකාවකි.

# මාලය පසුපස ඇති රහස...

කොරිඩෝවට වැටී ඇති හෙවණැලි අඳුර තව තවත් වැඩි කළේය. කොරිඩෝව දිගේ ඉදිරියටම ඇදුනු ඔවුන් කොරිඩෝව අවසානයේ ඇති පැරණි දොරක් දුටුවෝය. එය පැරණි සඟරාවල දක්වා තිබූ ඒවාට බෙහෙවින් සමාන විය.

ඔවුන් තිදෙනා දොර අසලට ළඟා විය. සෙලීනා එක අතකින් යතුරද අනෙක් අතින් විදුලි පන්දමද අල්ලා ගෙන සිටියාය. ඇගේ දෑත් සීතලට මෙන් තදින් වෙව්ලන්නට විය. ලයිරා සහ ටෙරියන් එකිනෙක දෙස මුහුණට මුහුණ බලා සිටින්නට විය. සෙලීනා යතුරු සිදුරට යතුර දැමූ පසු එය ක්ලික් හඬක් නඟමින් විවෘත විය. ඇයගේ හිසෙහි සිට පාදාන්තය තෙක් අකුණක් ගැසුවාක් මෙන් හැඟුණි. එකපාරටම දොර විවෘත විය. එය රහස් කුටියකි. එම රහස් කුටිය පැරණි ලියකියවිලි වලින් හා සිතියම් වලින්ද සමන්විත විය. ඒ අතර එළු හමින් කරන ලද කඩදාසියක් ද විය.

රහස් කුටියට ඇතුලු වූ ඔවුන් දුටුවේ බිත්තියේ හරි මැදට වෙන්නට තිබූ පින්තූරයකි. එහි රාමුවතරමක් අබලන් වී තිබුණත් ඇතුළත පින්තූරයට කිසිදු හානියක් සිදු වී නොතිබුණි. එහි වූයේ අවුරුදු 20-25 පමණ වයසැති තරුණියකි. ඇයගේ රන්වන් පැහැති හිසකෙස් ඉණ අසලට පමණ දික් වී තිබූ අතර ඇය ඉතා රූමත් කාන්තාවක් වූවාය. ඇය සුදු හා දුඹුරු පැහැති ගවුමක් ඇඳ සිටි අතර ඇය කහ පාට තොප්පියක් පැළඳ ගෙන සිටියාය. පින්තූරයට යටින් කිසිවක් සඳහන් කර තිබූ අතර අකුරු බොඳවී ගොස් තිබූ නිසා ඒ කුමක්දැයි පැහැදිලිව හඳුනා ගත නොහැකි විය. සෙලීනා හා ලයිරා ඒ දෙස මඳ වෙලාවක් බලා සිටියේ ඒ කවුරුන්දැයි හඳුනා ගැනීමට නොහැකි වූ නිසාය. එම පින්තූරයේ සිටි තරුණිය තම නෙත් පොළොව දෙසටම යොමු කරගෙන සිටියාය.

තවත් මොහොතක් ඒ දෙස බලා සිටි තිදෙනාම රහස් කුටිය තවත් පරීක්ෂා කිරීමට සිතූ නිස එයින් ඇස් ඉවතට ගත්හ. එත් සමඟම ඔවුන් දුටුවේ බිත්තියේ මැදට වෙන්නට යම්කිසි ආධාරකයක එල්ලා තිබූ පැරණි පෙට්ටියකි. එයට තරමක් සමීප වූ ඔවුන්ට දැක ගන්නට හැකි වූයේ පැරණි සඟරාවල ලියා තිබුණු අකුරු එම පෙට්ටියේත් සඳහන් වී ඇති ආකාරයයි.

එම පැරණි පෙට්ටිය විවෘත කල ඔවුන් දුටුවේ එහි ඇති ආරක්ෂාවට බඳින මාලයක් සහ කුඩා සටහනකි. එම සටහන දිග හැර බැලූ සෙලීනා එය කියවන්නට විය.

*මෙම මාලය ලබාගන්නාට සැඟවුණු සත්‍ය එළිදරව් කිරීමට ශක්තිය ලබා දෙනු ඇත.*

*අවවාදයයි...!*

*සත්‍ය සොයාගන්නේ නම් ඔබේ ජීවිතය සදහටම වෙනස් වනු ඇත.*

එම මාලයද අතේ තබාගෙන ඔවුන් මොහොතක් නිහඬව සිටියහ. සිසුන් තිදෙනට සිදුවන් සියල්ල අභිරහසකි. සැඟවුණු රහස කුමක්දැයි සිතමින් ඔවුන් තවමත් නැවතී සිටින්නෝය. ඔවුන් ඕනෑම දෙයකට මුහුණ දීමට සූදානම්ව සිටී.

පැරණි අශයට පැමිණ දැන් හෝරා කිහිපයක් ගත වී ඇත. සිදුවූ සියල්ල තවමත් ප්‍රහේලිකාවකි. ගතවන තත්පරයක් තත්පරයක් පාසා ඔවුන්ට විසඳීමට සිදුවන්නේ තවත් අභිරහසකි. සත්‍ය සොයා ගත යුතුය. නමුත් හමුවූ සටහන් වලින් කියැවෙන්නේ කුමක්ද???

*    *    *

සෙලීනා මාලය ගෙන තම ගෙලෙහි පැළඳ ගත්තාය. එක්වරම අඳුරු කුටියට එළිය කරමින් විස්මිත සිහින් ආලෝකයක් දල්වමින් එම පැරණි මාලයෙන් දිලිසීමක් ඇති විය. සියලුදෙනාම ඒ දෙස පුදුමයෙන් බලා සිටියහ. සෙලීනාට මාලයෙන් අමුතු උණුසුමක් දැනුනේ එය ජීවමානව කිසියම් ශක්තියකින් ස්පන්දනය වන්නාක් මෙනි.

“ අපි මේට ටෙස්ට් කරමු ” ටෙරියන් යෝජනා කළේය ඔහු අසල ඇති පරණ පොත් රාක්කයක් පෙන්වමිනි. ඔවුන් තිදෙනා පොත් රාක්කයට ළංවූ අතර සෙලීනා පැරණි දූවිලි සහිත ලියකියවිල්ලක් මත තම සුරත තබා ගත්තාය. එවිට මාලය වඩාත් දීප්තිමත් වූ අතර පෙරදී කිසිවක් සඳහන් වී නොතිබුණු ලියකියවිල්ලේ සැඟවුණු යමක් අලෝකමත් කළේය. එහි වදන් ප්‍රහේලිකාවක් සටහන් වී තිබෙනු ඔවුන් දුටුවෝය.

*සෙවණැලි දිවා ආලෝකය සොයන විට හදවත් තුනක් ඔවුන්ගේ මාර්ගය සොයාගත යුතුය.*

*ගවේෂණය කිරීමට නිර්භීත අය පමණක් දොරෙන් ඔබ්බට ඇති දේ දකියි.*

---

" මොකද්ද ඒකේ තේරුම ? " ලයිරා ඇසුවේ විස්මයෙනි.

" අපිට තව ගොඩක් දේවල් හොයාගන්න තියෙනවා වගේ " සෙලීනා කීවාය. කාමරයෙන් ඔබ්බට ඇති දෙයකට තම මනස සම්බන්ධ වූවාක් මෙන් ඇයට දැනෙන්නට විය.

ප්‍රහේලිකාවේ කරුණු අනුගමනය කරමින් ඔවුහු කුටියේ සියලු ස්ථාන පිරික්සූ අතර කුටියේ අස්සක් මුල්ලක් නැරම නරඹන්නට විය. අවසානයේදී ඔවුන්ට රක්කයක් පසුපස තිබූ පැරණි දොරක් හමු විය.

එම සැඟවුණු දොර ඡායාරූප වලින් ආවරණය වූ මාර්ගයකට සම්බන්ධ වූ අතර එම ඡායාරූප පාසලේ ඉස්සර සිටි ශිෂ්‍යයන්ට බොහෝ සෙයින් සමාන විය. එම ඡායාරූප තරමක් අද්භූත වූ අතර පැරණි හා අඳුරු ස්වාභාවයක් ඉසිලූහ. පැරණි වෙල්වට් රෙද්දින් කර තිබූ එම ඡායාරූප , ඇතැම් ඒවාවල රාමුව තරමක් අවපැහැ ගැන්වී තිබුණි. එම මාර්ගයේ ඇති තෙතමනය හා දූවිලි නිසා එය අවපැහැ ගැන්වී ඇති බව ඔවුන් සිතූහ. මාර්ගය දිගේ ඉදිරියටම ඇදුණු ඔවුන් සෙලීනාගේ රූපයට බෙහෙවින් සමානකම් දක්වන කලු පැහැති ගවුමකින් හා හිස්වැස්මකින් සැරසී සිටි තරුණියකගේ සිත්තුරයක් ඉදිරිපිට නතර විය. එය සොෆියා පැහැති පින්තූරයක් විය. පැරණි පින්තූර අසල තිබූ එය වඩාත් කැපී පෙනුනේ එය අලුත් පින්තූරයක් වූ නිසාය. සෙලීනාගේ හිසේ සිට පාදාන්තය තෙක් අකුණක් ගැසුවාක් මෙන් ඇයට හැගුණි. එම පින්තූරය බොහෝ සෙයින් සෙලීනා සමාන විය. අනෙක් දෙදෙනාත් තමන් මෙන්ම ගල් ගැසී සිටින බව ඇය දුටුවාය.

" අපි මොකක්හරි දෙයක කොටසක් නම් මොකද කරන්නේ? " ටෙරියන් මිමිණුවේ අනෙක් දෙදෙනාගේද බියට සවන් දෙමිනි. ඔවුන් තිදෙන එකිනෙකා අතර නොසන්සුන් බැල්මක් හුවමාරු කර ගත්හ. නමුත් සෙලීනාගේ යටි සිත ඇයට යමක් පැවසුවේ එය දිගටම කරගෙන යා යුතු බවයි. සත්‍ය, එය කුමක් වුවත් ඔවුන් එනතුරු බලා සිටින බවත් ය. ඔවුන් ගැඹුරු හුස්මක් ගෙන තමන්වම පාලනය කරගෙන අවසාන දොර විවෘත කළහ.

# *Mirror Of Daerd…*

ඔවුන් ඇතුළට යනවිට කාමරයේ කිසිදු වෙනසක් නොපෙනෙන්නට තිබූ අතර ඔවුන් තම ප්‍රතිබිම්භය නොපෙන්වන කැඩපතකට මුහුණ ලා සිටිනු දක්නට ලැබුණි. ඔවුන්ට මුලින්ම දුටු කැඩපත මතක් විය. ඔවුන්ට මතක් වූයේ මෙම කැඩපත ඔවුන් කලින් දුටු කැඩපතම වන බවයි. කැඩපතට පහළින් කිසිවක් සඳහන් වී තිබුණි.

---

*“ Daerd nees nuru oyt ubno itcel ferru oyt no wohsi ”*

---

“ මේ මොකද්ද? ” ටෙරියන් ඇසුවේ මහත් වික්ෂිප්තවය.

“ මේ මොනවගේ භාෂාවක්ද? ”

“ නෑ මේක වෙන භාෂාවක් වෙන්න බෑ ” සෙලීනා කීවේ බර කල්පනාවක යෙදෙමින් ය.

“ එහෙනම්…” ලයිරා ඇසුවාය

“ අපි මේක අනිත් පැත්තට කියවලා බලමු” සෙලීනා කීවේ ස්ථිර හඬකිනි.

“ I show not your reflection but your Unseen Dread ”

කැඩපත අනතුරු හඟවන සේයාවකින් දිලිසෙන්නට විය. එහි මතුපිට දිය සුළි ගැටෙන අඳුරු තටාකයක් බඳු විය. ඔවුන්ගේ ප්‍රතිබිම්භය වෙනුවට එහි ඔවුන්ගේ යටි සිතෙහි ඇති ගැඹුරු බියෙහි සේයාවන් දර්ශනය විය.

සෙලීනා කැඩපතෙන් තමාගේම සේයාව දුටුවාය. ඇය දුටුවේ ඇය තනිවම පාලු ස්ථානයක සිටින බවයි. ඇය දුටුවේ පාසලේ සියලුම ගොඩනැගිලි විනාශ වී ඇති බවයි. ලයිරා කැඩපතෙන් දුටුවේ ඇය සියලු විභාගයන් අසමත් වී ඇති බවත් ඇයගේ සියලුම මිතුරන් ඇයට අහිමි වී ඇය තනි වී ඇති බවත් ය. ඒ අතර ටෙරියන් මුහුණ පා සිටියේ ඉත හයංකර ගැටලුවකටය. ඔහු එම කැඩපතෙන් දුටුවේ ඔහු නපුරු සිහිනයක ජවනිකාවකට හසුවී පොළොව යට කුටියේ සදහටම තනි වී සිටින ආකාරයයි.

“ නෑ... ඒක වෙන්න බෑ...මේක ඇත්තක් නෙමේ...” ලයිරා කෑගැසුවේ අඩියක් පිටුපසට තබමින් ය. ඇගේ ඇස් භීතියේ ගිනි දැල් වලින් ඇවිලෙන්නට විය.

නමුත් සෙලීනාව කැඩපත දෙසට තල්ලු වෙමින් බලවත් සම්බන්ධයක් ඇති වෙනවා සේ අයට දැනුණි. “ ඉන්න ඉන්න... අපිට අපේ බයත් එක්ක එකට මුහුණ දෙන්න වෙනවා ” මෙය පැවසීමට ඇයගේ යටි සිතෙහි යමක් ඇයව පෙළඹවූවාය.

“ අපි දැන් ගොඩක් දුරට ඇවිත් තියෙන්නේ ඒ නිසා මේක අපිට නවත්තන්න බෑ ” ඔවුන්ට මුලදී හමුවුන සටහන්වල තිබූ දෑ මතක් විය.

දිගු හුස්මක් ගත් සෙලීනා අඩියක් ඉදිරියට තැබුවේ කැඩපත ස්පර්ශ කිරීමට සිතාගෙනය. ඇගේ ඇඟිලි කැඩපතෙහි මතුපිට ස්පර්ශ වෙද්දීමා එකපාරටම දිය රැලක් මෙන් ඇදී ගොස් කැඩපතෙහි ඇති දර්ශනය වෙනස් විය. එහි පෙන්නුම් කලේ මිතුරන් තිදෙනා එක්ව අඳුරට එරෙහිව සටන් කරන ආකාරයයි.

“ බලන්න... ” සෙලීනා කෑගැසුවාය. “ කැඩපත පෙන්නන්නේ අපි එකට ඉද්දී කොච්චර ශක්තිමත්ද කියලා. අපිට බෑ බයට අපිව වෙන් කරන්න දීලා නිකන් ඉන්න ”

ඔවුන් දැඩි අධිෂ්ඨානයෙන් යුතුව අත් අල්ලාගෙන කැඩපත ඉදිරියේ රවුමක් සෑදූහ. “ මන් මුල ඉදන් ගණන් කරාම අපි එකට මේවාට මුහුණ දෙමු ” සෙලීනා කීවාය.

“ එකායි...දෙකායි...තුනායි...”

“ අපි කිසිම දෙයකට බය වෙන්නේ නෑ ” නොවුන් කෑගැසූහ. එක්වරම මාලය දිලිසෙන්නට විය. කැඩපත දරුණු දියරැල්ලක් මෙන් රැලි ගැසූ අතර ඔවුන්ගේ බිය සහිත දර්ශනය වීදුරු මෙන් කැඩී , වර්ණවත් ආලෝකයේ කඳුරැල්ලක් බවට පරිවර්තනය විය. රහස් කුටිය ආලෝකයෙන් හාඅ උණුසුමෙන් පිරී ගිය අතර නැවත වරක් වායුගෝලයේ අඳුරු බව තුරන් වී ගියේය.

කෙමෙන් කෙමෙන් ආලෝකය තුනී වෙද්දීම ඔවුන් අලුත් කාමරයක සිටින බව ඔවුන්ට තේරුම් ගියහ. මෙය ඔවුන්ට අදහාගත නොහැකි විය. මෙම කාමරය විවිධ පොත්පත්වලින් හා ඉපැරණි කෞතුක භාණ්ඩවලින් සමන්විත ඉතා ආලෝකමත් කාමරයක් විය. කාමරයේ මැදට වෙන්නට කිසියම් ආධාරකයක් මත විශාල ලොග් පොතක් වැනි යමක් දැක ගන්නට හැකි විය. එහි පිටු දුර්වල ලෙස දිලිසෙන්නට විය.

“ එහෙනම් මේක තමයි අපි හොයාගන්න ඕන සත්‍ය ” ටේරියන් පැවසුවේ ඉදිරියට යමිනි. සෙලීනා ඉදිරියට යමින් පොත අතට ගත්තාය. එවිට මාලයෙන්කිසියම් ශක්තියක් දැනෙන්නට විය. ඇය එය විවෘත එහි ඇති අකුරු කැරකී කිසියම් වාක්‍යක් නිර්මාණය විය.

*අතීතය හෙළිදරව් කර ගැනීමට නම් එක් අයෙකු තදින් ආලෝකය වැළඳ ගත යුතුය.*

*සත්‍ය පමණක් සොයා ගැනීමට උත්සාහ නොකරන්න. ශක්තිය සමඟ එකට බැඳෙන්න.*

*ඔබේ ඉදිරි ගමන මෙතැන් සිට ආරම්භ වනු ඇත...*

" සෙලීනා අපි ආයෙත් යමුකෝ ඉස්කෝලෙට "ලයිරා කීවාය.

" කවුද දන්නේ මේක කොහෙන් ඉවර වෙයිද කියලා. අපිට ආයේ එළියට යන්න බැර්ටි උනොත්..." ටෙරියන් කීවේය.

" බෑ... ඔයාලට පිස්සුද... මතක නැද්ද අපිට කිව්වා මේ ගමන නැවැත්තුවොත් අපි හිරවෙනවා කියලා. අනික මේක විසඳගන්නකන් අපි දිගටම කරන් යන්න ඕනේ " සෙලීනා කීවේ ස්ථිර හඬකිනි.

අනෙක් දෙදෙනා හූමිටි තබමින් ඇගේ කතාව අසාගෙන සිටියහ. පොතෙහි පිටු දිගින් දිගටම පෙරලෙන්නට විය. එහි පිටු පාසලේ ඇති අභිරහස්, මාලය ගැන සැඟවුණු රහස් හා බිත්ති අතර සැඟවී ඇති රහස් වලින්ද පිරී ගියේය.

දිගටම කියවන් යන විට, පාසල ගොඩනගා ඇත්තේ පැරණි දුර්ලබ කෞතුක වස්තු හා බලගතු දැනුම ආරක්ෂා කිරීම සඳහා තමා විසින්ම ගොඩනගා ගත් පුද්ගල කණ්ඩායමකින් බව ඔවුන්ට දනගන්නට ලැබුණි. දිගටම කියවන් ගිය ඔවුන්ට දැක ගන්නට ලබුණේ පොතෙහි අවසන පිටුවේ යම්කිසි පණිවිඩයක් සඳහන් වී අති ආකාරයයි.

*මෙම මාලය නිර්මාණය කර ඇත්තේ මෙම පාසලේ ගැඹුරේ ඇති අඳුරු බලවේග මුද්‍රා තැබීමටයි.*

*නමුත් මෙහි ශක්තිය දුර්වල වෙමින් පවතී. එහි ආලෝකය ශක්තිමත්කර අඳුර විනාශ කල හැක්කේ සැබෑ මිත්‍රත්වයට පමණි.*

එකපාරටම ආලෝකය නිවා දමමින් කුටිය පුරා සිසිල් වාතයක් හමා යන්නට විය. කුටියේ සෑම අස්සක් මුල්ලක් නෑරම සෙවණැලි විසින් වෙලාගන්නට විය. අඳුරු වලාකුළු මෙන් වැඩිවමින් පැවති සෙවණැලි අතරින් එක්වරම මාලය දිලිසෙන්නට විය. එයින් ඇතිවූ උණුසුම සෙලීනාට දරාගත නොහැකි විය.

“ අපි ඉක්මන් කරන්න ඕනේ ” ලයිරාගේ ඇස් කඳුලින් තෙත් වූ අතර ඇය හැඩුම්බරව පැවසුවාය. “ අන්ධකාරය... ඒක එන්නේ අපේ පැත්තට ”

සෙලීනා එම මාලය ඔවුන්ව ආරක්ෂා කරනු ඇතැයි දැඩි බලාපොරොත්තුවකින් පසු වූයාය. ඇයට පොප්තෙහි තිබූ වචන මතක් වූවාය. එහි සඳහන් වූයේ ඔවුන්ගේ මිත්‍රත්වය මෙම අභිරහසට යතුරක් වෙනු ඇති බවයි.

“ මගේ අත් අල්ලගන්න ” සෙලීනා කීවාය.ලයිරා සහ ටේරියනුත් ඉක්මනට අත්වැල් බැඳගත්හ. අඳුරු වචනය අතරින් ඔවුන්ට ඇසුණේ ‘මරණය’ යන වචනය පමණි. එය බිත්තිවල වැදී නැවත නැවත දෝංකාර දුන්නේය.

එකට අත් අල්ලන් ඉන්න අතරේ සෙලීනාගේ ගෙලෙහි වූ මාලය දිලිසෙන්නට විය. එයින් නිකුත් වූ ආලෝකය ඔවුන්ට ඇස් ඇරගෙන සිටීමට පවා අපහසු විය. මාලයෙන් විහිදුනු ආලෝකය නිසාම අඳුරු සෙවණැලි සියල්ල පලා යන්නට විය. කාමරය නැවත කලින් තිබූ පරිදිම දිස් විය. ඒත් එක්කම අත් අතහැරි සෙලීනා මාලය අල්ලා ගත්තාය. දැඩි උණුසුමක් නිකුත් වූ මාලයෙන් ටිකෙන් ටික උණුසුම අඩු වෙන්නට විය.

නමුත් එක්වරම ඔවුන් පුදුමයට පත් වූයේ පෙර කිසිවක් නොතිබූ බිත්තියේ දැන් යමක් සටහන් වී ඇති ආකාරය දුටු නිසයි. එය තරමක් විශාල අකුරු වලින් යම් කිසි දියරයකින් ලියා ඇති බව දැක ගත හැකි විය.

---

*හදවත් තුන එකිනෙකාගෙන් වෙන් වූ විට ඔබලා සඳහටම අඳුරු සෙවණැලි අතර සිරවෙනු ඇත.*

*ගැළවීම ඇත්තේ හදවත් තුන එකට හමුවූ විට පමණී. නිවැරදි මාර්ගයට පිවිසීම සඳහා ප්‍රහේලිකා විසඳන්න.*

---

බිත්තියේ මෙසේ සඳහන් වී තිබුණි. “ ඒ කියන්නේ මොකද්ද? ” ලයිරා ඇසුවාය. “ මන් හිතන්නේ අපි තුන්දෙනා ගැන වෙන්න ඕන ” සෙලීනා කීවාය. “ ඒ කියන්නේ අපි තුන්දෙනාම එකට ඉන්න ඕන ” ටේරියන්ද තම කටහඬ අවදි කළේය.

එක්වරම බිත්තියේ තිබූ දෑ මැකී ගියේය. ඒත් සමඟම විශාල ශබ්දයක්ද නඟමින් බිත්තියේ ඇති ගල් එකිනෙකාගෙන් වෙන්වෙමින් දොරවල් තුනක් නිර්මාණය විය. එම දොරවල් තුනම ආරුක්කු හැඩයෙන් යුක්ත දුඹුරු පැහැති ගඩොලින් නිම වූ ඒවා විය. ඒවා සියල්ල එකිනෙකට සමාන විය.

" මොකක්..." ටෙරියන් විස්මයෙන් ඇසුවේය.

" අපි දැන් හරියටම කොයි දොරෙන්ද යන්නේ? " ලයිරා ඇසුවාය.

" ම්ම්ම්... ඔයාලට මතකයි නේද අපිට ප්‍රහේලිකා හම්බෙනවා කිව්වා කියලා. අපි ඒවා විසඳලාම බලමු " සෙලීනා කීවේ කල්පනාවෙන් ගිලිහෙමිනි.

ඔවුහු පළමු දොර අසලට ගියහ. ඒත් එක්කම එතන බිත්තියේ තිබුණු ගලක් ඉදිරියට පැමිණ කුඩා ලාච්චුවක් වැනි යමක් නිර්මාණය විය. එය ඇතුලේ කුඩා කොල කැබැල්ලක් තිබුණි. එය අතට ගත් සෙලීනා එහි සඳහන් වූ දෑ කියවන්නට විය.

---

*ප්‍රහේලිකාවකි...*

*අඳුර දුරලීමට ඔබ සතුව ඇති වටිනා ආයුධයකි. ඔබ මෙය අහිමි කරගන්නේ නම් ඔබට ඉදිරියට යා නොහැක. මෙය සියල්ලන්ටම හිමි වුවත් සැබෑ ආයුධය නිර්මානය වන්නේ අවංක හා පිරිසිදු සිත් ඇත්තන්ට පමණි.*

---

මෙය ඇසූ ලයිරා සහ ටෙරියන්ද බර කල්පනාවක වැටුණේය.

" අඳුර දුරලන්න අපි ළඟ මොකක්ද තියෙන්නේ? " ලයිරා ඇසුවාය.

" මේ මාලය වෙන්න බැරිද... " ටෙරියන් පැවසුවේය.

" නෑ... කොහෙත්ම මාලය නම් වෙන්න බෑ. මොකද මේ කියන ආයුධය හිමි වෙන්නේ අවංක හදවත් තියෙන පිරිසකට වෙන්න ඕනෙ " සෙලීනා ඉක්මනින් කීවාය.

" ම්ම්ම්... එහෙනම්... "

" මිත්‍රත්වය... ඒක තමා උත්තරේ. අපේ යාලුකම තමයි මේකට උත්තරේ " ටෙරියන් සතුටින් කෑගැසුවේය.

" ඔව්... ඒක තමයි... ඔයාලාට මතක නැද්ද කලින් අපිට කිව්වා සැබෑ මිත්‍රත්වයට මේකේ ඉස්සරහටම යන්න පුලුවන් කියලා "

“ ආ... ඔව්මයි ” ලයිරාත් සතුටින් උඩ පැන්නාය.

“ මිත්‍රත්වය ... ඒක තමයි මේකට උත්තරේ ” සෙලීනා හයියෙන් කෑගැසුවාය. විශාල ශබ්දයක් එක්කම පළමු හා අන්තිම දොර නැවත කලින් පැවති බිත්තිය බවට පත්විය. නමුත් මැද පිහිටි දොර පමණක් එලෙසම පැවතුණි.

මැද පිහිටි දොර අසලට ළංවූ ඔවුන් තිදෙනා දොරින් ඇතුලු විය.සිතියමේ සඳහන් ආකාරයටම ඔවුන් දොරින් එහා පිහිටි කොරිඩෝව දිගේ ඉදිරියටම ඇවිද ගියහ. එම කොරිඩෝව තරමක් අඳුරු දුර්වර්ණ වූ බිත්ති වලින් සමන්විත විය. එම බිත්ති එතරම් උස නොවූවත් ඒවා ගොඩක් පැරණි ඒවා බව දක්නට හැකි විය. එම කොරිඩෝවේ කිසිවක් නොතිබූ අතර ඉදිරියටම යන ඔවුන්ට දැකගත හැකි වූයේ කොරිඩෝව පටු වන බවයි. නමුත් ඉදිරියටම යන ඔවුන්ට බිත්තියේ මැදට වෙන්නට තිබූ අකුරු සහිත පුවරුවක් දැකගත හැකිවිය.

***~GUARDIANS OF THE LIGHT~***

**1883 NOVEMBER 22**

“ මන් හිතන්නේ මේක හදලා තියෙන්නේ 1883 අවුරුද්දේ වෙන්න ඕන ”

“ ඒ කියන්නේ දැනට අවුරුදු 100 කටත් වැඩියි ”

“ ඒත් ඇයි මෙහෙම එකක් හදලා තියෙන්නේ. මොකද්ද ඒකේ තේරුම ”

“ මන් හිතන්නේ මේ පැරණි අංශයේ ලොකු රහසක් හැංගිලා තියෙනවා. කවුරුහරි ඒක අඳුරු සෙවණැලිත් එක්කම වැළලෙන්න දීලා තියෙනවා ”

“ ඔව් ඒත් ඇයි එහෙම කරන්නේ? ”

“ මන් හිතන්නේ මේක තාම කවුරුවත් විසඳන්න නැතුව ඇති ”

තිදෙනා අතර මෙම කතාබහෙන් පසුව නැවතත් ඔවුන් බර කල්පනාවක. කවුද මේක හැදුවේ...මොකද්ද මේකේ තේරුම...

ඔවුන් නැවතත් මීටර් විස්සක් පමණ ඉදිරියට ඇවිද යද්දීම ඔවුන්ට කොරිඩෝව ඉවර වන බව හැඟී ගියේය. ඔවුන්ට ඉදිරියෙන් කොරිඩෝව හරස් කොට බැඳ තිබූ බිත්තියක් ඔවුන්ට දැක ගත හැකි විය. ඒත් එක්කම කොරිඩෝව එතනින් අවසාන විය.

# මරණයේ සෙවණැලි...

බිත්තියට ලඟා වූවාත් සමඟම එහි අත් සලකුණක් දැකගත හැකිවිය. එය සෙලීනා ස්පර්ශ කරනවාත් සමඟම බිත්තිය දෙපැත්තට ඇත් වී තවත් කුටියක් මතු විය. එම කුටියට ඔවුන් තිදෙනා ඇතුලු වෙනවාත් සමඟම දොර නැවතත් එකට එක්වී දොර සැඟවී යන්නට විය.

ඔවුන් තිදෙනා කුටියේ මැදට වෙන්නට සිටගෙන සිටි අතර සෙලීනාගේ ගෙලෙහි වූ මාලය තවමත් යාන්තමින් දිලිසෙමින් පැවතුණි. මාලයේ බලය අඩුවී යන බව ඔවුන් තිදෙනාටම හැඟී ගියේය.

ඒත් එක්කම නැවතත් අඳුරු සෙවණැලි ඔවුන් කරා පැමිණෙන්නට විය. එම සෙවණැලි කුණාටුවක් මෙන් ඔවුන් වටා කැරකෙමින් අන්ධකාරයත් සමඟම එකට පොරබදින්නට විය. මාලය නැවතත් දුර්වල ආලෝකයක් විහිදන්නට විය. සියල්ල දැන් පැහැදිලිය. ඔවුන් ඉක්මනින්ම ක්‍රියාත්මක විය යුතුය.

“ අපි මේක ඉක්මනින් විසඳන්න ඕන ” ටෙරියන් පැවසුවේ වෙව්ලන නමුත් අධිෂ්ඨානශීලී හඬකිනි. “ අන්ධකාරය හැමදේම විනාශ කරන්න කලින් අපි ඉක්මන් කරන්න ඕනේ ”

ගෙලෙහි වූ මාලය ගලවා අතට ගත් සෙලීනා එය තවත් තදින් අල්ලා ගත්තාය. “ අපි එකට හිටියොත් අපිට මේක කරන්න පුලුවන් ”

ඔවුන්ට ඉදිරියෙහි වූ විශාල ගල් දොරවල් දෙකක් ඔවුන් දුටුවෝය. ඒවායින් එකක් අමුතු පෞරාණික සලකුණු වලින් සහිත වූ අතර අනෙක හිස් දොරක් විය. එහි විවිධ සලකුණු හා සෙල්ලිපි සමහරක් ඒවා දුර්වල ලෙස දිලිසුන අතර අනෙක් ඒවා අඳුරු ඒවා විය.ඒත් එක්කම කුටිය තුළින් අඳුරු ඝෝෂාවක් දෝංකාර දුන්නේය. ඒත් සමඟම ඔවුන්ගේ ගමනාන්තයේ පළමු ප්‍රහේලිකාවට පෙනී සිටියේ ය.

## ▪ ප්‍රහේලිකා අංක 01 : *The Trial Of Harmony*

ගල් ද්වාරයේ සටහන්ව තිබූ දෑ දිලිසෙන්නට විය. ඒත් සමඟම බිත්ති අතරින් ගැඹුරු කටහඬක් දෝංකාර දෙන්නට විය.

---

*"ආයුධ සමාන වුවහොත් ඉදිරි මර්ගය විවෘත වනු ඇත"*

---

ඔවුන් සිටගෙන සිටි පොළොව එක්වරම දෙදරන්නට වූ අතර ඉක්මනින් ඔවුන් පැත්තකට පැන බිත්තියට හේත්තු වූහ. ඒත් සමඟම ඔවුන්ට යටින් තිබූ පොළොවෙහි ගල් මාරු වී ඒත් සමඟම කුටිය මැද ගල් කණු හතරක් දිස් වූ අතර ඒ සෑම කණුවක් ඉදිරියේම ප්‍රතිමා තලයක් ඩහක්නට ලැබුණි. සෑම ගල් කණුවක්ම ඉහත සඳහන් කළ වස්තූන් හතරෙන් එකක් නියෝජනය කළේය.

- වස්තූන් හතර නම්: ගින්දර, ජලය, පෘථිවිය හා වාතයයි. එමෙන්ම එම එක් එක් ගල් කණුව මත නොදැල්වූ ඉටිපන්දමක්, ජලය සහිත බඳුනක්, ගල් පුවරුවක් හා පිහාටුවක්ද විය.

" අපි මේ වස්තු හරියටම ගලපන්න ඕන " සෙලීනා කටහඬ අවදි කලේ ඔවුන්ට මඟපෙන්වීමක් ලෙස බිත්තියේ තිබූ සංකේත දෙසටද ඇස් යවමිනි.

" අපි මේවා හරිතැන තියන්න ඕන " ටෙරියන්ද පැවසුවේය.

ටෙරියන් සහ ලයිරා ඉක්මනින්ම කාමරය වටා ඇති ගල් පුවරු පරීක්ෂා කරන්නට විය. සෑම වස්තුවකටම අනෙක් ඒවා සමග සම්බන්ධ වීමට යම් කිසි විශේෂ ලක්ෂණයක් ඇති බව ඔවුන් වටහා ගත්හ.

ගල් පුවරුව පෘථිවිය සංකේතවත් කල අතර පිහාටුවෙන් වාතයද, ජල බඳුනින් ජලයද, නොදැල්වූ ඉටිපන්දමින් ගින්දර ද නිරූපණය කළේය. කල්පනාවේ යෙදී සිටි ටෙරියන් ටික වෙලාවකට පසු කටහඬ අවදි කළේය. යම් අත්හදා බැලීම් වලින් පසුව ටෙරියන් අවසානයේදී එය විසඳීය.

" ප්‍රධානම යතුර වන්නේ අපි අතර තියෙන බැඳීමයි, අපි අතර තියෙන මිත්‍රත්වයයි " ටෙරියන් පැවසීය.

" ජලය ගින්දර නිවා දමනවා. ඒ වගේම ගින්නට ඕනම ඉන්ධනයක් තමයි ඔක්සිජන්. එතකොට වාතය ඔක්සිජන් සපයනවා. ඒ වගේම ජීවිය ජලය රඳවාගෙන ඉන්නවා "

ඔවුන් තිදෙනා එකට එක්ව එම වස්තූන් නිවැරදි පිළිවෙළට තැබූහ. ඔවුන් පිහාටුව ගින්දර මතත්, ජල බඳුන ගල් පුවරුව මතත්, ඉටිපන්දම දල්වා ගල් පුවරුව මතත් රැඳවීය. ඉන්පසු ඔවුන් ගල් පුවරුව මත තිබූ කිසියම් බඳුනකට ජලය වත් කළේය.

ඒත් සමගම ගක් කණු සෙලවී ඒවා නැවත පොළොව යටට අතුරුදහන් වී සෙමෙන් සෙමෙන් දොරක් විවෘත වෙමින් නැවතත් අලුත් කාමරයක් විවර විය

* * *

## ▪ ප්‍රහේලිකා අංක 02 : *The Trial Of Light & Shadow*

දොර සෙමෙන් විවෘත වෙනවාත් සමගම කාමරය ඇතුළේ පිහිටි බිත්තියෙහි වූ විශාල කැඩපතකට මුහුණ ලා සිටින් බව ඔවුන් තිදෙනාම දුටුවෝය. කැඩපත ඔවුන්ගේ අතීත මතකයන් පිළිඹිබු කළේය.

ඔවුන් පැරණි පුස්තකාලයේ තිබියදී මාලය සොයා ගත් මොහොතේ ඔවුන්ගේ මිත්‍රත්වයේ බැඳීම දිනෙන් දින ශක්තිමත් විය. ඔවුන්ගේ අවිනිශ්චිතභාවය පෝෂණය කරමින් සෙවණැලි වලාකුළු මෙන් ඔවුන් වටා කැරකෙන විට ප්‍රතිබිම්භය දිලිසෙමින් මාරු විය.

" අපි මේ ප්‍රතිබිම්භය සම්පූර්ණ කරන්න ඕන. ඒත් මට තේරෙන්නේ නෑ ඒක කොහොමද කරන්න ඕන කියල " සෙලීනා මිමිණුවාය.

ඒත් සමගම නැවත වතාවක් බිත්ති අතරින් ගැඹුරු කටහඬක් දෝංකාර දෙන්නට විය.

" අන්ධකාරය පරාජය කිරීමට නම් ඔබ තුළ ඇති සත්‍යය පිළිඹිබු කල යුතුය "

කැඩපතට එහා පැත්තට වෙන්නට බිම වස්තූන් කිහිපයක් විය. පළිහුවක්, කැඩුණු වීදුරු කැබැල්ලක් සහ පැරණි පොතක්ද විය. එම පොතෙහි පිට කවරයේ " මිත්‍රත්වයේ හදවත " ලෙස සටහන් කර තිබුණි.

ටේරියන් පොත අතට ගත්තේය. " සමහර විට මේක වෙන්න ඕන... ම්ම්ම්... අපිට අපේ මිත්‍රත්වය හා අපේ ඉදිරි ගමන ගැන ප්‍රතිබිම්බයක් ඕන වෙනවා. අපේ මිත්‍රත්වයේ බැඳීම තමයි මේකට යතුර වෙන්නේ..."

ඔවුන් තිදෙනාම කණ්ණාඩිය ඉදිරිපිටට පැමිණි අතර එඅම කැඩපත අවසාන වතාවටත් බැබලෙන්නට විය. ලයිරාගේ කටහඬ බිඳුණු ස්වාභාවයක් ගත්තේය.

" අපි එකට හිටියම ගොඩක් ශක්තිමහත්. අපි මීට කලිනුත් අන්ධකාරයට මුහුණ දීලා තියෙන නිසා මේ සැරෙත් අපිට ඒක කරන්න බැරි වෙන එකක් නෑ '

" අපි එකට මේක කරමු " සෙලීනා කීවාය.

ඔවුන් තිදෙනාම එකට කැඩපත මත අත් තබන විට ඔවුන්ගේ මුහුණුවල ප්‍රතිබිම්භය සමඟ මුසු වී දීප්තියෙන් බබලන්නට විය. ප්‍රතිබිම්බයේ වූ ඡායාරූපය දිය වී යන්නට වූයේ සත්‍යයේ ඉදිරි මාවත හෙළිදරව් කරමිනි.

ඒත් සමගම කැඩපත අතුරුදහන් වූ අතර ඒ වෙනුවට ආලොකය විහිදුවමින් රන් දොරටුවක් දිස් විය.

*   *   *

# හෙළිදරව්ව...

දොර විවර වෙනවාත් සමඟම ඔවුන් විශාල විවෘත කුටියකට ඇතුලු විය. කුටිය මධ්‍යයේ වෙන්නට යම්කිසි වේදිකාවක් මැද දිදුලන ආලෝකයෙන් වට වූ පුරාණ ලියවිල්ලක් තැන්පත් කර තිබුණි. ඔවුන්ගේ මිත්‍රත්වයේ දීප්තියෙන් එහි අන්ධකාරය මැකී ගොස් තිබුණි.

සෙලීනා ඉදිරියට ගොස් ලියවිල්ල සෙමෙන් දිග හැරියාය. එය ලියා තිබුණේ පැරණි අකුරු වලින් වුවද ඇයට එය යම්තාක් දුරට කියවාගන්නට හැකිවිය.

“ පාසල ගොඩනගා ඇත්තේ ලෝකය විනාශ කිරීමට තර්ජනය කල අන්ධකාරයෙන් ලෝකය ආරක්ශා කිරීමටය. ඔබ රැගෙන ආ මාලය නිකන්ම නිකන් පළිඟක් නොවේ. ඔබේ බැඳීමේ සැබෑ බලය අගුළු හැරීමට යතුරකි. අන්ධකාරය යනු අඳුරු බලවේගයක් නොවේ. එය ස්වාභාවධර්මයෙන්ම බියෙහි හා සැකෙහි ප්‍රතිමූර්තියකි. සැබෑ මිත්‍රත්වයේ ශක්තිය විශ්වාස කරන්නන්ට පමණක් අන්ධකාරය දුරු කළ හැකිය ”

සෙලීනා එම ලියවිල්ල අනෙක් දෙදෙනාටත් ඇහෙන්න කියවන විට කුටියේ වූ වාතය යම්කිසි ශක්තියකින් හමා යන්නට විය. පාසල ආලෝකයෙන් ස්පන්ධනය වූ අතර සෙලීනාගේ ගෙලෙහි වූ මාලය පෙරටත් වඩා දීප්තිමත්ව දිලිසෙන්නට විය.

කුටිය තරමක් තදින් කම්පනය වූ අතර මෙවර කිසිම අනතුරක් නොවුණි. එය ශක්තීන්ගේ මුසුවීමකින් සිදුවන්නට විය. සැබෑ මිත්‍රත්වයේ බැඳීම එය ඉවතට තල්ලු කරන විට අන්ධකාරය සම්පූර්නයෙන්ම පහව යන්නට විය.

ලයිරා සහ ටේරියන් සෙලීනා දෙස බැලූහ. “ අන්තිමේදී අපි ඒක කළා ” ලයිරා කීවාය

සෙලීනාසිහින් සිනහවක් මුවගට සිනහවක් නගාගනිමින් “අපි ඒක කළා හැමෝම එකට” යි කීවාය.

# රහස් කුටියේ අවසාන හෙළිදරව්ව...

සෙලීනා, ලයිරා සහ ටේරියන් අද්භූත කුටිය තුළට ගැඹුරට ගිය අතර ඔවුන්ගේ අඩි සද්දය පුරාණ ගල් බිත්තිවලට එරෙහිව දෝංකාර දෙන්නට විය. කලක් ඔවුනට තර්ජනයක් වූ සෙවණැලි තවමත් වාතයේ රැඳී තිබුණේය. සෙවණැලිවල විකෘති ස්වරූපය දැන් අඳුරු වලාකුළු මෙන් කුටියේ මුලුවල කැරකෙමින් පවතී. නමුත් ආපසු හැරී යාමට බැරි තරම් දුරක් ඔවුන් පැමිණි බව තිදෙනාම හොඳින් දැනගෙන සිටියහ. ශතවර්ශ ගණනාවක් තිස්සේ පාසල හා එය තුල සඟවා තිබූ අඳුරු බලවේගය පිටුපස ඇති සත්‍යය අඟුළු හැරීමට ඔවුන්ගේ අවසාන අත්හදා බැලීම්වලට මුහුණ සිදුවිය.

කාමරය මධ්‍යය මාලයේ වූ ආලෝකයෙන් ආලෝකමත් වූ අතර ඔවුන් ටිකක් අමුතු වස්තූන් දෙකක් දුටුවෝය. ඔවුන් ඉදිරිපිට විශාල ගල් කුළුණක්ද එහි මතුපිට කිසියම් සංකේත දෙකක්ද කැටයම් කර තිබුණි.

ටේරියන් එහි ඇති සංකේත පරීක්ෂා කළේය. එයින් එකක් කිසියම් යතුරකට සමාන වූ අතර අනෙක ඇසකට සමාන විය.

“ මේක අන්තිම ප්‍රහේළිකාවේ කොටසක් වෙන්න ඕන ” ටේරියන් කීවේය. “ ඒත් මේකා මොන වගේ දේකටද අපිව පොළඹවන්නේ ??? ”

තිදෙනාම කුළුණ ඉදිරිපිට සිටගෙන සිටියෝය. ඒ අතර කුටිය තුළින් නැවත ගැඹුරු කටහඬක් දෝංකාර දෙන්නට විය.

“ ඉදිරියට යාමට නම් ඔබ නැවතත් ප්‍රහේළිකා දෙකක් විසඳිය යුතුය. යතුර සහ ඇස ඔබගේ මාර්ගෝපදේශයන් වේ. රහස හෙළි කළහොත් සත්‍ය එළිදරව් වනු ඇත ”

කටහඬ කෙමෙන් කෙමෙන් අඩු විය. මිතුරන් තිදෙනා නිහඬ කුටිය තුළ නිශ්ශබ්දතාවයේ ගිල්වමින් කටහඬ පහව ගියේය. තුනී වාතය ශක්තිමත් පෞරාණික යමක් සමඟ ඉහළට නැගී ආවේ විසඳීමට තවත් දෑ ඉතිරි කරමින්ය.

# Key to the path

සෙලීනා පියවරක් ඉදිරියට තැබුවේ ඒ මොහොතේ තිබූ බර ඇයට දැනුණු නිසාය. " අපි යතුරින් පටන් ගමු " ඇය කීවාය. ඇය යතුරෙහි සංකේතය මත අත තැබූ අතර තිදෙනාවම පුදුමයට පත් කරමින් ඇයගේ අතට යටින් තිබුණු ගල ඇගේ ස්පර්ශයට දෙපැත්තට මාරු විය. කුළුණ කොටස් දෙකකට බෙදී ඉදිරියට යන පටු, දිදුලන මාර්ගයක් හෙළි කළේය. යතුරේ සංකේතය දිදුලමින් කුටීරය මත උණුසුම් ආලෝකයක් දැල්වූයේය.

" මාර්ගය විවර වුණා " ටෙරියන් පැවසුවේ දැල්වෙන ඇස් වලින් යුක්තවය. " අනිවාර්යයෙන්ම මේක වෙන්න ඕන ප්‍රහේළිකාවේ පළවෙනි කොටස. ඒත් මොකද්ද ඒකෙ තේරුම " ලයිරා ඇසුවාය.

සෙලීනා පටු මාර්ගය දෙස හොඳින් බැලුවාය. " මට පේන්නේ අපි මේක දිගේ ඇවිදන් යන්න ඕන. ඒත් මොකද්ද අපි හොයාගන්න ඕන "

ඔවුන් පියවරෙන් පියවර ඉදිරියට යද්දීම නැවතත් අර කටහඬ ඇසෙන්නට විය. නමුත් මෙවර ඉතා දැඩිව එය ඇසෙන්නට විය.

" යතුර කිසිවෙකුට මාර්ගය හෙළි නොකරයි. පිරිසිදු හදවත් ඇත්තන්ට පමණක් ඉදිරියට යාහැක. ඔබේ විශ්වාසවන්ත භාවය තහවුරු කරන්න. එවිට ඔබට මෙය පසු කල හැක "

ඒත් සමඟම ලයිරා පටු මාර්ගයට පාදය තබනවාත් සමඟම ඇගේ හදවත වේගයෙන් ගැහෙන්නට විය. එහෙත් ඇය පාදය තබද්දීම ඇයට පහළින් කිසියම් දීප්තියක් ඇති වී කිසියම් හෙවණැල්ලක් ඇය ඉදිරියේ මතු විය. එම සෙවණැල්ල ඇඹරෙමින් එතෙමින් හා කැරකෙමින් ඇයගේ මාර්ගය හරස් කළේය." මේ මොකද්ද??? ඒක අපේ පාර හරස් කරනවා "ඇය ඉදිරියෙන් තැබූ පාදය පස්සට ගනිමින් කීවාය.

සෙලීනා ඉදිරියට පැමිණ මාලය තදින් අල්ලා ගත්තාය. " යතුරට අවශ්‍ය වෙන්නේ අපේ විශ්වාසයයි. අපේ හදවත් වල තියෙන පිරිසිදු බවයි. අපි එකිනෙකාට උදව් කරගෙන ඉදිරියට ය්න්න ඕන "

" අපි එකට හිටියනම් ඒක කරන්න පුලුවන්. අපි ආලෝකය ගැන විතරක් හිත යොමුකරගෙන අන්ධකාරය පළවා හරින්න ඕන " ටෙරියන් මිමිණුවේය.

ලයිරා වෙරියන්ගේ අත අල්ලගනිද්දීම සෙලීනාත් ඉදිරියට පැමිණ ඔවුන්ගේ අත් අල්ල ගත්තාය. ඔවුන්ගේ අත් එකිනෙකා සමඟ බැදෙද්දීම ඔවුන් වටා තිබුණු ආලෝකය දීප්තිමත්ව බබළන්නට විය. ඔවුන් එකට තව තවත් ඉදිරියට ඇදෙද්දී අන්ධකාරය පසු බැස්සේය.

ඉදිරි මර්ගය පැහැදිලිය. එක් ප්‍රහේලිකාවක්ද විසඳා අවසන් ය. ඉදිරියට කුමක් සිදුවේදැයි කවුරුත් නොදනී.

# The Eye of Truth

සෙලීනා , ලයිරා සහ ටෙරියන් තවමත් රහස් කුටිය තුළය. තත්පර, මිනිත්තු, පැය, දින ගණන් ගතවෙනවා ඒත් ඔවුන්ට කාලය පිළිබඳ කිසිදු නිනව්වක් නොමැත.රහස් කුටියේ අවසානය කුමක්ද? හැමෝම කතාවෙන පාසලේ සැඟවිලා තියෙන රහස මොකද්ද???

*   *   *

දීප්තිමත් පටු මාර්ගය අවසානය තෙක් ඇවිද ගිය ඔවුන් දුටුවේ නැවතත් දුර්වල ආලෝකයකින් බැබලෙන කුළුණකි. නමුත් මෙවර තිබුණු ඇසෙහි සංකේතය පෙරටත් වඩා දිලිසෙන්නට විය. ඔවුන් එය අසළට ලගා වනවාත් සමඟම අවට ඇති වාතය තව තවත් සිසිල් විය. ඒත් සමඟම කුටිය පුරා හමාගිය සුළඟින් ආලෝකය නැති කළේය.

“ ඒක තමයි ඇස ” ටෙරියන් කීවේ වෙව්ලමිනි. “ ඒත් ඒක අරින්නේ කොහොමද කියලා අපි හොයා ගන්න ඕන ”

නැවතත් බිත්ති අතරින් ශබ්දය ඇසෙන්නට විය. නමුත් මෙවර එහි ස්වරය පෙරටත් වඩා බලවත් විය. “ ඇස මත සත්‍ය රඳා පවතී මතුපිටින් දකින අයට පමණක් එහි ඇති ශක්තිය විවෘත කළ හැකිය. තේරවිල්ල විසඳන්න ”

ඒත් සමඟම කුළුණෙහි වූ ගල් තලය මාරු වූ අතර ඒත් සමඟම තේරවිල්ල අවට වාතයෙහි දිස් විය.

*මට නගර ගොඩක් තිබ්බත් ගෙවල් නෑ. වනාන්තර තිබ්බත් ගස් නෑ. ගංගා, දියඇලි තිබ්බත් වතුර නෑ. ඒත් මම කවුද?*

ළමුන් තිදෙනා එකිනෙක දෙස බැලූ අතර ඔවුන්ගේ මනසවල් පෙරළී කරන්නට විය. ලයිරා සහ ටෙරියන් දුටුවේ එක්වරම සෙලීනාගේ මුහුණ දීප්තිමත් මදහසකින් පිරීයන ආකාරයයි.

“ සිතියම...සිතියම තමයි උත්තරේ. ඒකෙ නගර තියෙනවා. එතකොට තව නගර, වනාන්තර... ඒත් ඒවා ඇත්ත ඒවා නෙමෙයිනේ ” සෙලීනා කීවාය.

සෙලීනා උස් හඬින් පිළිතුරු දුන්නාය. ඇගේ මුවින් වචනය පිටත් වෙද්දිම කුළුණෙහි වූ ඇසෙහි සංකේතය වඩාත් දීප්තිමත් වන්නට විය. එහි ආලෝකය කුටිය පුරාම ගලා ගන්නට විය. සෙවණැලි තවදුරටත් පහව ගිය අතර ඒත් සමඟම කුළුණෙහි යටින් තිබූ තවත් කුටියක් විවෘත කිරීම සඳහා කුළුණෙහි පාදය දෙබෑ විය.

එහි ඇතුළත් අවසන් ලියවිල්ල තවමත් බලා ගෙන සිටී.

* * *

# සත්‍යයේ හෙළිදරව්ව...

සෙලීනාගේ අතෙහි තිබූ ලියවිල දිග හැරිය විට  එය පැරණි සංකේත හා විවිද සළකුණු සහිත පාසලේ සිතියමක් බව පෙනී ගියේය. මලය තුල තිබූ බලයෙන් ලියවිල්ල තව තවත් දිලිසුණි.

“ ඉස්කෝලේ රහස ” වෙරියන් මිමිණුවේ සෙලීනා ලියවිල්ල කියවීමට ආසන්න වෙද්දීය.

සිතියමේ පාසල තුල ගැඹුරේ සැඟවුණු කුටි සවිස්තරාත්මකව දක්වා තිබූ අතර සෑම කුටියක්ම පුරාණ වස්තුවලින් පිරී තිබුණේ ඒවා අන්ධකාරය මුද්‍රා තැබීමට නිර්මාණය කර තිබූ බව සඳහන් කරමිනි. පාසලේ ගැඹුරේම පිහිටි වඩාත් රහසිගත කුටියේ සැඟවී තිබූ පාසලේ බලයන් පිළිබඳ මූලාශ්‍ර සහිත රහස් ශක්තීන්ගෙන් යුතු ළිඳක්ද සිතියමේ සඳහන් විණි.

ලියවිල්ලේ අවසාන පේළිය සත්‍ය හෙළි කළේය.

---

*සැබෑ මිත්‍රත්වය දීප්තිමත්ව බැබලෙන විට හා නොසැලෙන විශ්වාසයකින් හා එකමුතුකමකින් මුණගැසුණු විට පමණක් සෙවණැලි සඳහටම දුරුවනු ඇත.*

---

# අවසානය...

සෙලීනා, ලයිරා සහ ටේරියන් කුටිය මැද සිටින විට උෂ්ණත්වය පහත වැටුණු අතර වාතය ඉතා ඝන විය. මාලය දුර්වල ආකාරයකින් බැබලුණු අතර එහි දීප්තිය වර්ධනය වන අන්ධකාරය වැළැක්වීමට වෙර දැරුවේය. ඒත් සමඟම කාමරයේ ඈත කෙළවරේ සිට සෙවණැලි ඔවුන්ගේ ආත්මය සිදුරු කිරීමට මෙන් දඟලමින් විවිධ හැඩවලින් මතුවීමට පටන් ගත්තේය.

“ එයාලා මෙතන ” සෙවණැලි ඉදිරියට ඇදෙද්දීම ටේරියන් ලයිරාගේ අත අල්ලාගෙන හයියෙන් කෑගැසුවේය.

“ එකට ඉන්න! ” සෙලීනා අතෙහි වූ මාලය ඔසවාගෙන කෑගැසුවාය. “ මේක තමයි අපේ අන්තිම අවස්ථාව ”

නමුත් අන්ධකාරය එය ගිල දමන්නාක් මෙන් මාලයෙහි දීප්තිය අඩු විය. සෙවණැලි අතරින් කිසියම් මිමිණීමක් නිකුත් වූයේ සැකය හා බිය තව තවත් ඔවුන්ගේ මනස සිසාරා පතුරවමිනි.

“ ඔයාලාට මේක දිනන්න බෑ ” සෙවණැලි අතරින් ඇසුනේය. “ යාලුකම ඉක්මනට බිදෙනවා. ලේසියෙන්ම කඩන්න පුලුවන් ”

ටේරියන් අනෙක් දෙදෙනා දෙස බැලුවේ භීතිය ඔහුගේ මුහුණ වසාගනිද්දීය. “ එයාලා හරිනම් අප්පි මොකද කරන්නේ?? එහෙනම්... ”

“ නැහැ...! ” සෙලීනා ඔහු වාක්‍යය කියා නිම කරන්නටත් පෙර ඔහුට බාධා කළාය. ඇයගේ කටහඬ ඉතා ශක්තිමත් විය. “ අපි මෙච්චර දුරක් ආවේ අපේ බැඳීම නිසා. අපිව කාටවත් වෙන් කරන්න දෙන්න බෑ ”

ඒත් එක්කම සෙලීනාට කලින් පොතෙහි තිබූ වචන මතක් විය. ‘ සැබෑ බැඳීමකට පමණක් ආලෝකය ශක්තිමත් කල හැකිය ’ සෙලීනා ගැඹුරු හුස්මක් ගෙන ටේරියන් සහ ලයිරා දෙසට අත දිගු කලේ ඔවුන්ගේ අත් අල්ලා ගැනීමටය.

“ මාව විශ්වාස කරන්න ” ඇය පැවසුවාය. “ අපි එකට හිටියොත් අපිට මේක කරන්න පුලුවන් ” ඇගේ කටහඬ ස්ථිර නමුත් තැන්පත්ය.

ලයිරාගේ සහ ටෙරියන්ගේ අත් සෙලීනාගේ දෑත්වල ගැටෙද්දීම මාලයෙන් උණුසුම් ආලෝකයක් පිටවිය. සෙවණැලි වියරුවෙන් කෙඳිරිලි නැගූ අතර ඒවා ළමුන් දෙසට දිව ගියේය. නමුත් ඔවුන්ගේ එකමුතුකමේ ශක්තියෙන් මාලයේ ආලෝකය තවත් පුළුල් විය. ආලෝකයෙන් සෙවණැලි දැවෙන විට සෙවණැලි කෑගසමින් කුටීරයේ ඈතට ගොස් පසු බැස්සේය.

එකපාරටම කාමරය දරුනු ලෙස සෙලවී ගිය අතර බිත්ති කඩා වැටීමට පටන් ග්ත්තේය. ඒත් සමඟම ගල් යට සැඟවී තිබූ ඉපැරණි බිතුසිතුවමක් දිස්විය. එම සිතුවමේ මීට දශක ගාණනකට පෙර සිටි පාසලේ නිර්මාතෘවරුන් මාලය අල්ලගෙන සිටි අතර ආලෝකයෙන් නිර්මාණය වූ කවයක් වටා ඔවුන්ගේ දෑත් යා වී තිබුණි.

“ මේ තමයි අපේ පාසල හදපු අය ” ලයිරා කීවේ විස්මයෙනි. “ එයාලා මේක අඳලා තියෙන්නේ අන්ධකාරයෙන් අපේ පාසල ආරක්ෂා කරන්න ” ටෙරියන් කීවේ සිතුවමට පහළින් ඇති කිසියම් සෙල්ලිපියක් පෙන්වමිනි.

---

*මාලයෙහි බලය රැඳී ඇත්තේ ආලෝකයේ නොව එකමුතුකමෙහි ය.*

---

අවසාන සෙවණැල්ලත් කුටියෙන් පහව ගිය අතර මාලය අවසාන වතාවට දිදුලන්නට විය. නිශ්චල කුටිය තුළ රහස් දොරක් විවෘත වූ අතර ඔවුන්ව නැවත පිටතට ගෙන ගියේය.

* * *

සෙලීනා , ලයිරා සහ ටෙරියන් නැවතත් පාසල් පුස්තකාලය තුළ එකට සිටගත් අතර සෙලීනාගේ අතෙහි වූ මාලය නැවත සෑදිය නොහැකි ආකාරයට කැඩී ගොස් තිබුණි.

“ අපි ඒක කරා... ” ටෙරියන් පැවසුවේ ඔහුගේ කටහඬ නොඉවසිල්ලෙන් හා බියෙන් පිරී යන අතරේදීය.

“ අන්ධකාරය ගිහිල්ලා. දැන් පාසලේ රහස අපිත් එක්කම ආරක්ෂිතව තියෙනවා ” සෙලීනා සිහින් හඬින් කීවාය.

ඔවුන් පුස්තකාලයේ පිටව යන විට ඔවුන්ගේ මිත්‍රත්වයේ බැඳීම නොබිඳිය හැකි ලෙස වර්ධනය වී ඇති බව ඔවුහු දැන සිටියහ. පාසල තවදුරටත් ඉගෙනීමේ ස්ථානයක් පමණක්ම නොවීය. එය මිත්‍රත්වයේ බලය පිලිබඳ සාක්ෂියකි. එය දැන් ඔවුන් කොටසක් වී ඇති උරුමයකි.

# ~සමහර විට පාසලේ රහස මෙය විය හැකි ය~

පාසල මුලින්ම ඉදිකරන ලද්දේ ආලෝකයේ ආරක්ෂකයන් ලෙස හැඳින්වෙන කිසියම් පුද්ගල කණ්ඩායමක් විසිනි. ඔවුන්ගේ මෙහෙවර වූයේ සියවස් ගණනාවකට පෙර මුද්‍රා තැබූ මහා අන්ධකාරයෙන් ලෝකය ආරක්ෂා කිරීමයි. මෙම මුද්‍රාව පවත්වා ගැනීමට ප්‍රධානම ආයුධය වූයේ මාලයයි. යතුර දුර්වල වුවහොත් සැබෑ හදවත් සහ ශක්තිමත් බැඳීම් ඇති අයට පමණක් එයට ප්‍රවේශ විය හැකි බව සනාථ කිරීම සඳහා නිර්මාතෘවරුන් විසින් ප්‍රහේලිකා, කුටි හා ආරක්ෂිත මායා කර්ම නිර්මාණය කරමින් පාසලේ ගැඹුරේ මාලය සඟවා තැබීය.

අවසාන කුටියෙහි හෙළිදරව් කරන ලද බිතු සිතුවමේ ආරම්භකයින් එකමුතුව සිටගෙන සිටින අතර සෑම කෙනෙකුටම අත් අල්ලාගෙන ඔවුන්ගේ ශක්තිය මාලය වෙතට යොමු කරන ලදි. එය පැහැදිලි කලේ පාසල යනු ඉගෙනීමට ස්ථානයක් පමණක් නොවන බවයි. එය අන්ධකාරයේ සිරගෙය මත ඉදිකරන ලද බලකොටුවක් බවත් එය ලෝකයාට මුදා හැරියොත් ලොව පුරා අවුල් ජාලයක් පැතිර යා හැකි බලවේග අල්ලා සිටින බවත් ය.

පාසලේ සැඟවී ඇති රහසෙහි අවසානය නම් පාසලට යන සිසුන් නොදැනුවත්වම ආලෝකයේ ආරක්ෂකයන්ගෙන් පැවත එන්නන් වීමයි. ශිෂ්‍යන් අතර මිත්‍රත්වය හා එකමුතුකමේ බැඳීම පෝෂණය කිරීම ඔවුන්ගේ මෙහෙවරේ ආත්මය ජීවමානව තබා ගන්නා බවත් කාලය ගෙවී ගියත් මුද්‍රාවේ ශක්තිය සහතික කරන බවත් ආරම්භකයින් විශ්වාස කරන බවත් ය.

සිසුන් තිදෙනා මෙම රහස සොයාගත් විට ඔවුන්ගේ ගමන සෙවණැලි පලවා හැරීමක් පමණක් නොවන බව ඔවුන්ට වැටහී ගියහ. එය ඔවුන් ඊළඟ පරම්පරාවේ ආරක්ෂකයින් බවට පත්වීමයි. දැන් පාසලේ සැබෑ උරුමය දැන් ඔවුන් අතේ රැඳී තිබේ...දැන් ඔවුන් නිකන්ම නිකන් ශිෂ්‍යයන් පමණක් නොවේ. ඔවුන් දැන් ආලෝකයේ ආරක්ෂකයින් ය...

* * *

පාසලේ රහස දැනගත් පසු සෙලීනා, ලයිරා සහ ටෙරියන්ට ලෝකය අඳුරෙන් ආරක්ෂා කිරීමය යතුර ඔවුන් වන බව තේරුම් ගියේය.

ඔවුන්ගේ මිත්‍රත්වය හා ශක්තිය ඒකාබද්ධ කිරීමෙන් ඔවුන් මාලයේ සම්පූර්ණ බලය ක්‍රියාත්මක කරයි. යහපත සදහාම අඳුරු සෙවණැලි පලවා හැරියේය. ඔවුන්ගේ ගමන හරහා ඔවුන් ගොඩනගා ගත්මිත්‍රත්වයේ බැඳීම මාලය මඟින් තවත් ශක්තිමත් කරන අතර එයින් නිකුත් වන ආලෝකය සෙවණැලි නැවත වරක් පාසල් ගැඹුරේ මුද්‍රා තැබුවේය.

අවසානයේදී තිදෙනා එකට සිටගෙන සිටි අතර ඔවුන්ගේ මිත්‍රත්වය මාලය මෙන් බබළන්නට විය. ඔවුන් ආලෝකය ආරක්ෂාකරන්නන්ගේ උරුමය ඉදිරියටම ගෙන යාමට සූදානම් බව පෙන්වා දුන්නේය.

ඔවුන්ගේ කාර්යය ඉටුවීමත් සමඟ ඔවුන් කුටියෙන් පිටව යන්නේ දැනට සෙවණැලි මුද්‍රා තබා ඇති බවත් ලෝකයේ ආරක්ෂාව සැමවිටම මිත්‍රත්වයේ ශක්තිය මත රඳා පවතින බවත් දන්නා බැවිනි.

ඉතින් මෙතැන් පටන් ඔවුන් හට විශාල වගකීමක් පැවරී තිබේ... ඒ මුළු ලෝකයම අන්ධකාරයෙන් ආරක්සා කිරීමයි...

## *ඔවුන්ගේ මතකයන් ඔවුන් සමඟම වැළලී යාවී...!*


# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැඟීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි. මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැපකිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුයි.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලබෙන ආස්වාදය වෙන කිසිවකින්වත් ලබාදිය නොහැකියි. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමංග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ප්‍රශ්න ගැටලු නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්


~ GUARDIANS OVER THE SHADOW ~
අන්ධකාරයේ සෙවණැලි
ආලෝකයේ ආරක්ෂකයින් විසින්
නිර්මාණය කරනු ලැබූ පාසලක්...
අන්ධකාරය මුද්‍රා තැබීමට තනනු
ලැබූ රහස් දොරටුවක්...
පාසලේ සැඟවුණු රහස සොයා
පියමං කරන මිතුරන් තිදෙනෙක්...
අඳුරු සෙවණැලි සමඟ
පොර බඳින මිත්‍රත්වයක්...
මේ සියල්ල හමුවේ අවසානය
කෙසේ සිදුවේද...